(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 177.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 සැප්තැම්බර් 08 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1190/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චි නගරය මධ්‍යයේ පිහිටි මහජන ක්‍රීඩාංගනය 2010 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, අද වනතුරු එම ක්‍රීඩාංගනය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ භාවිතය සඳහා පවරාදී නොමැති බව දන්නේද;

(ii) එම ක්‍රීඩාංගනය කවර මට්ටමේ ක්‍රීඩාංගනයක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) මේ දක්වා මෙම ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) පසුගිය වර්ෂ 10 තුළ එම ප්‍රතිපාදනවලින් වැය කර ඇති ප්‍රමාණය කොපමණද;

(v) එම ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් සඳහා මෙතෙක් ගිවිසුම් ගතවී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) වර්තමානයේ ඉදිකිරීම් සිදුකරන කොන්ත්‍රාත්කරුවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම දිස්ත්‍රික්කයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඇතිවී තිබෙන බලපෑම කවරේද;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1528/2025

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පරිගණක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ සහ සුහුරු පුවරු වැනි උපකරණ අලුත්වැඩියා කිරීමේදී බොහෝ පාසල් අභියෝගයන්ට මුහුණ දෙන බව දන්නේද;

(ii) පාසල්වල පවතින ඉලෙක්ට්‍රොනික උපකරණ අක්‍රිය වන අවස්ථාවල අලුත්වැඩියා කළ යුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) උතුරු පළාතේ පාසල්වල ඇති ඉලෙක්ට්‍රොනික උපකරණ අතරින් අක්‍රියව පවතින උපකරණවල ප්‍රතිශතය කලාප අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පළාතේ ඇතැම් කලාපවල ඇති තොරතුරු තාක්ෂණ විෂයට අදාළ ගුරු හිඟය හේතුවෙන් කලාප මට්ටමේ තාක්ෂණ කණ්ඩායම ඵලදායි ලෙස යොදාගැනීමට නොහැකිවී ඇති බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාසල්වල ඇති පරිගණක දෘඩාංග අලුත්වැඩියා කටයුතු සඳහා පසුගිය වර්ෂ 05 තුළ වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මුදල් ප්‍රතිපාදන පාසල්වල පරිගණක දෘඩාංග අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණවත් වන්නේද;

(iii) පාසල්වල පරිගණක දෘඩාංග අලුත්වැඩියාව සඳහා තිරසර සැලැස්මක් ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1645/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල හැඹිලි දැල් මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන යාත්‍රා සඳහා බලපත්‍ර ලබාදීමේ ප්‍රමාදයක් සිදුවන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන්, නිශ්චිත කාලයකදී පමණක් අස්වැන්න ලබාගත හැකි මසුන් ඇල්ලීම සිදු කිරීමට නොහැකිවී ඇති බවත්;

(iii) බලපත්‍ර නොමැතිව ධීවර කටයුතුවල යෙදීම හේතුවෙන් ධීවරයින්, ධීවර ආම්පන්න සහ යාත්‍රා, නාවික හමුදා නිලධාරින් සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තු නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර, දඩ මුදලක් නියම කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i)හි සඳහන් බලපත්‍ර ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) ඉදිරියේදී නියමිත කාලය තුළ බලපත්‍ර ලබා දීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1660/2025

ගරු වානක මාදුගොඩ මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා ඇති සතොස වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2024 ජනවාරි මාසයේ සිට 2025 ඔක්තෝබර් මාසය දක්වා වසා දැමීමට කටයුතු කරන ලද සතොස වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත කාලසීමාව තුළ සමස්ථ සතොස වෙළඳසැල් ජාලය ලබා ඇති ලාභය සහ වියදම එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, කරාපිටිය සතොස වෙළඳසැල මේ වනවිට වසා දමා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1740/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004.12.26 දින ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආපදාවට ලක්වූ ජනතාවට නිවාස අහිමිවූ බවත්;

(ii) එම ජනතාව සඳහා රජය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පෞද්ගලික ඉඩම්වල සහ රජයේ ඉඩම්වල විකල්ප නිවාස ඉදිකර ලබාදී ඇති බවත්;

(iii) එම විකල්ප නිවාස, සර්වෝදයපුරම්, සෙංකාමම්, හිජ්රා නගර්, කනහර් ගම්මානය, කෝමාරි 1 සහ කෝමාරි 2 යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි රජයේ ඉඩම්වල ඉදි කර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) වසර 18කට අධික කාලයක් ගතවී ඇතත් මේ වනතෙක් එම ජනතාවට අදාළ ඉඩම් ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ජනතාවට කඩිනමින් ඉඩම් ඔප්පු ලබාදීම සඳහා ගෙන ඇති හෝ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1827/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්ෂයකට මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාවෙහි සහ තුවාල ලබන සංඛ්‍යාවෙහි සාමාන්‍යය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් තාවකාලිකව සහ ස්ථිරව ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් සංඛ්‍යාවෙහි සාමාන්‍යය කොපමණද;

(iii) අනතුරුවලට ලක්වූවන් සඳහා වර්ෂයකට වෙන් කරනු ලබන ඇඳන් සංඛ්‍යාවෙහි සහ ඇඳන් භාවිතා කරන දින ගණනෙහි සාමාන්‍යය කොපමණද;

(iv) මාර්ග අනතුරුවලට ලක්වූවන් සඳහා ප්‍රතිකාර ලබාදීම සඳහා වර්ෂයකට වැයවන ආසන්න වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2236/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ධීවර සහ වාණිජ වරායක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 'ඔලුවිල් වරාය' පිහිටුවන ලද බව දන්නේද;

(ii) එම වරාය පිහිටුවා මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) වරායේ ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍ය ආධාර සැපයූ විදේශ රාජ්‍යය කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(v) වරායේ මෝය කට වැලි තැන්පත් වීම හේතුවෙන් එහි මෙහෙයුම් කටයුතු අත්හැර දැමීමට පෙර, එය කාර්යක්ෂමව ක්‍රියාත්මකවූ කාලසීමාව කොපමණද;

(vi) එම වරාය අක්‍රිය තත්ත්වයට පත්ව මේ වනවිට ගතවී ඇති කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වරාය ආරම්භයේදී එමඟින් ප්‍රතිලාභ ලැබූ ධීවරයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එමඟින් ප්‍රතිලාභ ලබන ධීවරයන් සිටින්නේද;

(iii) එසේ නම්, එම ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම වරාය ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට සහ රටේ ආර්ථිකයට දායකත්වය ලබාදිය හැකි අයුරින් ප්‍රතිසංස්කරණය කිරීමට රජය සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2267/2026

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශය සතුව පවතින මුද්‍රණාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම මුද්‍රණාල පිහිටි ස්ථාන සහ වර්තමාන ක්‍රියාකාරී තත්ත්වය කවරේද;

(iv) ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මුද්‍රණාල තිබේ නම්, ඒවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) එම මුද්‍රණාල යථා තත්ත්වයට පත් කිරීමෙන් අත්වන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින මුද්‍රණාල මඟින් සිදු කරනු ලබන කාර්යභාරය කවරේද;

(ii) අමාත්‍යාංශය යටතේ මුද්‍රණාල පැවතීම හේතුවෙන් රජයට අත්වන ප්‍රතිලාභ කවරේද;

(iii) මුද්‍රණාල නවීකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන),— (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන),— (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 202 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මැයි 19 දිනැති අංක 2489/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.08.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජුනි 17 දිනැති අංක 2493/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.08.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය,— 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික, එකී පනතේ 13 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු හෙයින් ද;

කොමිෂන් සභාව සඳහා පත් කරනු ලබන සාමාජිකයින් අතරින් සභාපතිවරයා ද ඇතුළුව අවම වශයෙන් තිදෙනෙකු (03) පූර්ණ කාලීන සාමාජිකයින් වශයෙන් පත් කිරීමට අදාළ පනතේ 5(5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පැවරෙන කාර්යභාරයේ වැදගත්කම ද සැලකිල්ලට ගනිමින්, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම සඳහා 2026.08.10 දිනැති අංක 26/1522/819/010-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇති හෙයින් ද:—

(i) සභාපතිවරයා වෙත මාසිකව රු.135,000.00ක ද, සාමාජිකයින් වෙත මාසිකව රු.90,000.00ක ද පාරිශ්‍රමික ගෙවීමට;

(ii) සභාපතිවරයා සඳහා මාසිකව රු.6,000.00ක ද, සාමාජිකයින් වෙත රු.4,250.00ක ද සන්නිවේදන දීමනාවක් ගෙවීමට; සහ

(iii) මාසික ඉන්ධන හා ප්‍රවාහන දීමනාව පහත පරිදි ගෙවීමට:

| | ඉන්ධන දීමනාව | ප්‍රවාහන දීමනාව* |
|---|---|---|
| සභාපති | 220L | රු.50,000.00 |
| අනෙකුත් සාමාජිකයින් | - | රු.25,000.00 |

* සභාපතිට ප්‍රවාහන දීමනාව හිමි වන්නේ රජය විසින් රියදුරෙකු සහිත නිල වාහනයක් ලබාදිය නොහැකි අවස්ථාවන්හිදී පමණි.

ඊට අනුකූලව, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාරව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට ඉහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ගෙවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*5.

අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*13.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

16.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2166/2026

ගරු තුරෙෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'දිට්වා' සුළි කුණාටුවෙන් හානියට පත් රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වලට සිදුවූ හානියේ ස්වභාවය සහ ඇස්තමේන්තුගත හානිය;

(iii) එම පාසල්වල හානි යථා තත්වයට පත්කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට රජය, අමාත්‍යාංශය, පළාත් සභා, විදේශ ආධාර වැඩසටහන් සහ අනෙකුත් ආයතන මගින් ලබාදී ඇති මූල්‍ය ප්‍රතිපාදන;

(iv) එම මූල්‍ය ප්‍රතිපාදන මගින් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලද පාසල් සංඛ්‍යාව;

(v) මේ වනවිට සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය මුළු මුදල කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2183/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම පිහිටි 'කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයට' යාබදව, මීට පෙර 'බණ්ඩාරගම සති පොළ' පැවති පරිශ්‍රයේ කසළ එක්රැස් කරමින් පවතින බව දන්නේද;

(ii) එම පරිශ්‍රය තුළ කසළ එක්රැස් කිරීම සිදු කරනු ලබන ආයතනය කවරේද;

(iii) පරිශ්‍රය තුළ කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අනුමැතියන් ලබා ගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කසළ එක්රැස් කරන ස්ථානයේ සිට —

(i) බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාගාරයට ඇති දුර;

(ii) බණ්ඩාරගම පිහිනුම් තටාකයට ඇති දුර;

(iii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් පරිශ්‍රයට ඇති දුර;

(iv) විවෘත ව්‍යායාම මධ්‍යස්ථානයට ඇති දුර;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙලෙස අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන කසළ එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය හේතුවෙන් බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පුහුණුවීම් සිදු කරන ජාතික නෙට්බෝල් කණ්ඩායම ඇතුළු එම ක්‍රීඩාංගනය පරිහරණය කරන ක්‍රීඩකයන් මුහුණදී ඇති සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් සිදු කරන ලද දැනුම්දීම්වලට අනුව ගෙන ඇති පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2184/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර, බෙල්ලන, එගොඩවත්ත පාරේ පදිංචි බී.වී. විජේසිරි යන අය ඇතුළු පිරිසක් විසින් 'පාරම්පරිකව කුඹුරු ඉඩම් වෙත භාවිතා කළ ප්‍රවේශ මාර්ගය අවහිර කිරීම' සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලකට අදාළව, 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 90(1) වගන්තිය ප්‍රකාරව, කළුතර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් 2024.11.07 දිනැති අංක DAD/KL/L/04/පරි/2024 දරන නියෝගය නිකුත් කර ඇති බව දන්නේද;

(ii) එම නියෝගය මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බවත්, එය බලාත්මක කිරීම සඳහා වගකිවයුතු නිලධාරීන් පියවර ගෙන නොමැති බවත් දන්නේද;

(iii) ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ප්‍රයෝජනය සඳහා භාවිතා වන එම කෘෂි මාර්ගය හරහා කපිල කන්නන්ගර නමැති අයෙකු විසින් නීති විරෝධීව හා බලහත්කාරයෙන් ඉදිකර ඇති ගේට්ටුව සහ වැට කඩිනමින් ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2256/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.04.05 දින ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඩිජිටල් පරිවර්තනය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එම ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද;

(iii) ගිවිසුම ප්‍රකාරව ගිවිසුමේ එක් එක් පාර්ශ්වය සතු වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට එම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රගතිය කවරේද;

(v) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා ආයෝජනය කර ඇති මුදල කොපමණද;

(vi) එම ගිවිසුම අනුව කටයුතු කිරීම ප්‍රමාදවී තිබේද;

(vii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?